# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 6 දරන ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේව සභාවේ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 08 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1991 මාර්තු මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 60 යි.

තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 6 දරන ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාවේ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 8 වන දින]

**එල්. ඩී.—ඕ. 56/89**

## ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාවේ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සමිතියක්, එම සමිතියේ සාමාජික යන් එකඟ වූ රීති අනුව, ඒ සමිතියට හා ලෝක ව්‍යාප්ත ඇපොස්තලික දේවසභාවේ ලංකා මණ්ඩලයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණ හෙයින් ද:

ඒ සමිතිය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ සමිතිය විසින් මෙතෙක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1991 අංක 6 දරන ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාවේ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාවේ සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාවේ සමිතියේ දැනට සාමාජික යන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකාවේ ඇපොස්තලික දේවසභාවේ සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද එය පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුද්ධ වූ ධර්මය දේශනා කිරීම, පතුරුවා හැරීම සහ ප්‍රචලිත කිරීම ;

(ආ) බයිබලයේ අනුමත අනුවාදයට අනුකූලව ශුද්ධ වූ ලියවිල්ල ඉගැන්වීම ;

(ඈ) ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ පොත්පත්, පෙළපොත්, කලාප, සඟරා, පත්‍රිකා මුද්‍රණය කිරීම, පළ කිරීම හා බෙදා හැරීම ;

(ඉ) යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අළලා මහජන ශුභාරංචි රැස්වීම්, සාකච්ඡා, සම්මේලන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් කෙලින්ම හෝ වෙනත් යම් සංවිධාන සමඟ එක්ව හෝ ආයතන පිහිටුවා ගැනීම හෝ පවත්වා ගෙන යාම ;

(උ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට ආනුෂංගික වූ හෝ හිතකර වූ ද සියලු ක්‍රියා හා වෙනත් දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයෙහි නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම ද ඇතුළුව සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් සිදු කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද නිලධර යන්ගෙන් සහ වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත කළමනාකාර කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේදී ධුරදරූ සමිතියේ කළමනාකාර කමිටුව සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම, විශ්‍රාම යෑම හෝ පහ කිරීම සඳහා ද, සහ කළමනාකාර කමිටුවේ නිල ධරයන් තෝරා පත්කර ගැනීම සඳහා ද සංස්ථාවේ කළමනාකාර කමිටුවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ හා සේවකයන් ගේ කාර්යය ඉටු කිරීම සඳහා සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස් ථාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා හා එකී පරමාර්ථ මුදුන්

පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන් ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජික යන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ නැත හොත් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදී මෙන් පසු එවැනිම රැස්වීමක දී සහ ඒ ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ කිසිම රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු නොලැබිය යුතු අතර, ඒ වෙනස් කිරීම්, එකතු කිරීම්, සංශෝධනය කිරීම් හෝ පරිච්ඡින්න කිරීම් කළමනාකාර කමිටුව විසින් පූර්වයෙන් අනුමත කර තිබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී සමිතියේ බලපැවැත්වූ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

**සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.**

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති සමිතියේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව**

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** කළමනාකාර කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන් කෙරෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ජන/ එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.